ආයුර්වේද වෛද්‍ය සභාව 2012
-------------------------------------

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

**<u>විගණන මතය</u>**

1.1 **<u>තත්ත්වාගණනය කළ මතය</u>**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද වෛද්‍ය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතයවේ.

1:2 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1:2.1.**<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය

(අ) වාහන ලාංඡන නිකුත් කිරීමේ ගාස්තු ලෙස රු.28,000 ක් හා නාමලේඛන පිටපත් ගාස්තු ලෙස රු.260 ක් අදාල ගිණුම්වල නිවැරදිව සටහන් කොට නැවත එම වටිනාකම් වල එකතුව වන රු.28,260 ක් විවිධ ආදායම් ගිණුමටද බැර කර තිබුණි. මේ නිසා වර්ෂයේ ආදායම රු.28,260 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා රු.16,734 ක් හා දුරකථන ගාස්තු රු.980 ක් ගිණුමේ අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2011 වර්ෂයේ ස්ථාවර වත්කම් අපහරණය කිරීමෙන් පසු ඉවත්කිරීමේ ගිණුමෙහි වූ රු.44,270 ක පාඩුව සම්පූර්ණ අලාභයක් ලෙස ගිණුම්ගතකර තිබුණ අතර ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද රු. 15,650 ක මුදල ගිණුම් වලට ගලපා නොතිබුණි.

1:2:2.**විගණනය සඳහා සාක්ෂි නොවීම**

2012 දෙසැම්බර් 31 දින වන විට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වූ වෛද්‍යවරුන් භෛසජ්ජකවරුන් හා හෙදියන් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කළ ලේඛනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද අන්තර්ජාලය මගින් ප්‍රකාශයට පත්කර තිබුණු ලියාපදිංචි වෛද්‍යවරු පිළිබඳ තොරතුරු යාවත්කාලීන කර නොතිබුණු අතර එක් එක් දිස්ත්‍රික්කය අනුව යාවත්කාලීන කළ ලේඛණයක් පිළියෙල කර නොතිබුණි.

1:2:3.**නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් අනාවරණය විය.

(අ) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ III වන කොටසේ 11(1)(ඉ) වගන්තිය ප්‍රකාර ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් අතරින් තෝරා පත් කරගනු ලැබූ සාමාජිකයින් 3 දෙනෙකු ද, සභාවේ සංයුතියට ඇතුළත් විය යුතු වුවද, සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන් කිසිවකු ඇතුළත්ව නොතිබුණි.

(ආ) 2005 ජුලි 15 දිනැති අංක 14/ 13/08(3) දරන ආයුර්වේද වෛද්‍ය සභා පත්‍රිකාව අනුව 2006 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වර්ෂ 05 කට වරක් වෛද්‍යවරුන් තම ලියාපදිංචිය යාවත්කාලීන කර ගත යුතුය. තවද ඒ සඳහා ලියාපදිංචි ගාස්තුවක් අයකළ යුතු බවට තීරණය කර තිබුණත් 2012 දෙසැම්බර් 31 දින වන විටද එය ඉටුකර නොතිබුණි. තවද මෙම තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා නීතිමය අවහිරතා පැවතීමත් ඒ පිළිබඳ සංශෝධන නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති බවත්, සංශෝධිත ආචාරධර්ම අනුමත වීමෙන් පසු ඉදිරි කටයුතු සිදු කිරීමට 2012 අප්‍රේල් 03 දින වෛද්‍ය සභාව තීරණය කර ඇති බව දන්වා ඇතත්, එම නීති කෙටුම්පත් 2013 ජුනි දක්වා අනුමත කරගෙන නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂය තුළදී සභාවේ කටයුතුවල මෙහෙයුම් ප්‍රතිඵලය රු.96,820 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,354,333 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.1,257,513 ක ඌණතාවයේ අඩුවීමක් පෙන්නුම් කෙරිණි. මුළු ආදායම ඉකුත් වර්ෂයේ ආදායමට වඩා සියයට 22 ක් හෙවත් රු.1,260,704 කින් වැඩිවීම එම ඌනතාවය අඩුවීම කෙරෙහි බලපා තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුළදී සභාවේ මෙහෙයුම් කටයුතු සහ ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචන විස්තර පහත දැක්වේ.

| | 2012 වර්ෂය | 2011 වර්ෂය | (අඩුවීම/වැඩිවීම) | ප්‍රතිශතය (අඩුවීම/වැඩිවීම) |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| අයභාරය- රජයේ ප්‍රතිපාදන | 4,700,000 | 3,900,000 | 800,000 | 21 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 2,361,369 | 1,900,665 | 460,704 | 25 |
| මුළු ආදායම | 7,061,369 | 5,800,665 | 1,260,704 | 22 |
| පරිපාලන වියදම් | 6,809,911 | 6,790,628 | 19,283 | 1 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 348,278 | 364,370 | (16,092) | (5) |
| මුළු වියදම | 7,158,189 | 7,154,998 | 3,191 | 0 |
| වාර්ෂික ඌනතාවය/ අතිරික්තය | (96,820) | (1,354,333) | 1,257,513 | 93 |

2012 වර්ෂයේදී මුළු ආදායම රු.1,260,704 ක් හෙවත් 22% කින් වැඩි වුවද මුළු වියදම වැඩිවී තිබුණේ රු.3,191 කින් පමණි.

## 3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1. <u>කාර්ය සාධනය</u>

#### 3.1.1. <u>වෛද්‍යවරුන් ලියා පදිංචි කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ දෙකක ලියාපදිංචි වෛද්‍යවරුන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | **2012 දෙසැම්බර් 31 දිනට** | **2011 දෙසැම්බර් 31 දිනට** | **2010 දෙසැම්බර් 31 දිනට** |
|---|---|---|---|
| <u>සර්වාංග</u> | | | |
| උපාධිධාරීන් | 2,109 | 1974 | 1812 |
| ඩිප්ලෝමාධාරීන් | 5,024 | 4929 | 4840 |
| පාරම්පරික | 5,340 | 5295 | 5265 |
| <u>පාරම්පරික විශේෂ</u> | | | |
| සර්ප විෂ | 3,469 | 3442 | 3413 |
| කැඩුම් බිඳුම් | 2,182 | 2138 | 2108 |
| අක්ෂි රෝග | 626 | 625 | 623 |
| චර්ම රෝග | 529 | 528 | 526 |
| ගෙඩි වන | 360 | 355 | 354 |
| ජලභීතිකා | 180 | 180 | 180 |
| දැවුම් පිළිස්සුම් | 80 | 78 | 77 |
| මානසික | 149 | 144 | 141 |
| විදුම් පිළිස්සුම් | 07 | 07 | 07 |
| වෙනත් | 658 | 658 | 658 |
| එකතුව | 20,713 | 20,353 | 20,004 |

අක්ෂි රෝග , චර්ම රෝග, ගෙඩිවන, දැවුම් පිළිස්සුම් යන පාරම්පරික විශේෂ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී වැඩිවී තිබුණේ පහකට අඩු සංඛ්‍යාවකින් වු

අතර, ජලභීතිකා, විදුම් පිළිස්සුම් සහ වෙනත් යටතේ පාරම්පරික විශේෂ වෛද්‍යවරුන් ලියාපදිංචි වීමක් 2010 වර්ෂයෙන් පසු සිදු වී නොතිබුණි.

පසුගිය වසර පහක එක් එක් වර්ෂයේ වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම පහත දැක්වේ.

| වෛද්‍යවරුන් | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|
| උපාධිධාරීන් | 135 | 162 | 161 | 190 | 142 |
| ඩිප්ලෝමාධාරීන් | 95 | 89 | 91 | 72 | 74 |
| පාරම්පරික | 45 | 30 | 75 | 48 | 58 |
| පාරම්පරික විශේෂ | 85 | 68 | 148 | 165 | 129 |
| | ------ | ----- | ------ | ------ | ------ |
| | 360 | 349 | 475 | 475 | 403 |
| | ==== | === | ==== | ==== | ==== |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයට සාපේක්ෂව ඩිප්ලෝමාධාරීන් හැර අනෙක් සියළුම වර්ගයේ වෛද්‍යවරුන්ගේ ලියාපදිංචි වීම 2012 වර්ෂයේ දී අඩු වී තිබුණි.

(ආ) පාරම්පරික විශේෂ වෛද්‍යවරුන්ගේ ලියාපදිංචි වීමේ අඩුවීමක් අනාවරණය වු අතර එය 2008 වර්ෂයේදී 129 ක් වු අතර 2011 වර්ෂයේදී 68 ක් දක්වා අඩුවී 2012 වර්ෂයේදී නැවත 85 දක්වා වර්ධනය වී තිබුණි.

(ඇ) උපාධිධාරී වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය 2009 වර්ෂයේදී 190 ක් වු අතර 2012 වර්ෂය වනවිට එය ක්‍රමයෙන් 135 ක් දක්වා අඩුවී තිබුණි.

3.1.2. <u>කමිටු පත්කිරීම</u>

පහත සඳහන් අනු කමිටු 2008 සිට 2012 වර්ෂය දක්වා අඛණ්ඩව පත්කර තිබුණත් එම කමිටු අක්‍රිය වීමෙන් අපේක්ෂිත කාර්යය ඉටු වී නොතිබුණි.

(අ) දේශීය කැඩුම් බිඳුම් වෙදකම පිළිබඳ වෘත්තීය වැඩසටහන

(ආ) දේශීය පාරම්පරික දැනුමට අදාල දත්ත මූලාශ්‍ර පිහිටුවීමේ කමිටුව

(ඇ) අභාවයට යන විදුම් පිළිස්සුම් වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීමේ අනුකමිටුව

(ඈ) පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ විෂය නිර්දේශය සංශෝධනය කිරීම

(ඉ) පශු වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීම පිළිබඳ අනු කමිටුව

3.1.3 **වෛද්‍ය සභා අත්පොත් ඉදිරිපත් කිරීම**

ආයුර්වේද වෛද්‍යවරුන් වෙනුවෙන් සකස් කරන ලද වෛද්‍ය සභා අත්පොත 2012 දෙසැම්බර් වනවිටත් ප්‍රකාශයට පත්කිරීම හා ලියාපදිංචි වෛද්‍යවරු වෙත බෙදාදීම සිදුකර නොතිබුණි.

3.1.4. 2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගතිය

2012 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් වූ පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටුකර නොතිබුණි.

(අ) ආයුර්වේද වෛද්‍ය සභාවේ නෛතික රාමුව බලගැන්වීම හා ආයුර්වේද පනතේ නීතිමය නියෝග සැළසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම

(ආ) වෘත්තීමය අධිකාරි බලය පිරිනැමීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම

(ඇ) පවත්නා වෘත්තීය සුදුසුකම් පදනම් කරගනිමින් වෛද්‍ය වෘත්තිකයින් ප්‍රභේදකරණය

(ඈ) ආයුර්වේද වෘත්තිකයන්ගේ වෘත්තීය ආචාරධර්ම මාලාව හඳුනා ගැනිම

(ඉ) ආයුර්වේද වෘත්තිකයන්ගේ වෘත්තීය හැසිරීම/ චර්යාව විමර්ෂණය කිරිමේ ක්‍රියාවලියක් ඇති කිරීම

(ඊ) ආයුර්වේද වෛද්‍ය සභාවේ සම්පත් හා පහසුකම් යාවත්කාලීන කිරීම මගින් එහි කාර්යසාධනය වැඩිදියුණු කිරීම

(උ) ආයුර්වේද සංරක්ෂණ සභා වලින් සිදුවන අක්‍රමිකතාවයන් අවම කර සභාව සමඟ සෘජු සම්බන්ධතාවයක් ගොඩනැඟීම සඳහා කටයුතු කිරීම

(ඌ) වෘත්තීය සංවර්ධන වැඩසටහන්

(එ) විශේෂිත වැඩසටහන්

(ඒ) <u>නිලවෙබ් අඩවියට ආයුර්වේද වෛද්‍යවරුන් පිළිබඳ දත්ත ඇතුළත් කිරීම</u>

2012 දෙසැම්බර් 31 දින වන විට ලියාපදිංචි කළ මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව 20,713 ක් වුවද, වෛද්‍ය සභාවේ නිල වෙබ් අඩවියට ඇතුළත් කර තිබූ වෛද්‍යවරුන්ගේ නම් සංඛ්‍යාව 3,000 ක් වී තිබුණි. මෙම වෙබ් අඩවිය 2010 සැප්තැම්බර් 27 දින ආරම්භ කර තිබුණි.

3.2. <u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුර | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | වාර්ෂික වැටුප |
|---|---|---|---|---|
| | | | | රු. |
| ලේඛකාධිකාරී | 01 | 01 | - | 246,300 |
| ක.සහකාර | 09 | 08 | 01 | 2,778,724 |
| කා.කම්කරු | 02 | 01 | 01 | 237,042 |
| | 12 | 10 | 02 | 3,262,066 |

4. <u>ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය</u>

4.1 <u>අභ්‍යන්තර විගණනය</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

(ආ) දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් ආයුර්වේද වෛද්‍ය සභාවේ අභ්‍යන්තර විගණනය සිදු කළයුතු වුවද 2012 වර්ෂයට අදාළව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර 2011 වර්ෂයේදී එක් වතාවකදී පමණක් දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් විගණනයක් සිදුකර තිබුණි.

4.2 <u>විගණන කමිටු</u>

ආයතනය තුළ විගණන කමිටු පිහිටුවා නොතිබුණු අතර, දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන විගණන හා කළමනාකරණ කමිටුව සඳහා වෛද්‍ය සභාව සහභාගී වී තිබුණි.

## 5. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය යාවත්කාලීන කිරීම